**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය - 2018**

**------------------------------------------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

විජය කුමාරතුංග ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආරෝග්‍යශාලා මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආරෝග්‍යශාලා මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආරෝග්‍යශාලා මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආරෝග්‍යශාලා මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලිද ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආරෝග්‍යශාලා මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආරෝග්‍යශාලා මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 ප්‍රකාරව පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ, විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ගෙවීම් (Retirement Benefits Obligation Paid) ලෙස රු.6,921,869 ක ධන මුදල් ප්‍රවාහයක්, දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා රු.19,042,601 ක හා ගැලපීම් ලෙස රු.506,833 ක ඍන මුදල් ප්‍රවාහයන් දෙකක් දක්වා තිබුණු නමුත් එම වටිනාකම්වල නිවැරදිතාවය තහවුරු නොකෙරුණි. | පෙර සිටි ගණකාධිකාරිනිය විසින් 2017 වසරේදී මෙන්ම පසුගිය වසරවලදීද මෙසේ සාවද්‍ය අගයන් ඇතුළත්කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුලනය කර තිබුණු බව, ඇය මේ වන විට සේවයෙන් පහකර ඇති බැවින් නිශ්චිත පිළිතුරක් ලබාදීම අපහසු බව, 2019 වර්ෂයේදී නිවැරදිව මුදල් ප්‍රවාහ ප්රකාශය පිළියෙල කිරීමට පියවර ගෙන ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතය ප්‍රකාරව, මුදල් ප්‍රවාහයේ ස්වභාවය නිවැරදිව දැක්වෙන පරිදි හා මුදල් ප්‍රවාහයන් පැහැදිලිව හඳුනාගත හැකි පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ආ | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි, වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත්කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.739,212ක් 2018 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ආ සමුච්චිත ලාභයට ගලපා තිබුණි. | ඉදිරියේදී මෙවැනි දෝෂ අවම කර ගැනීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතය ප්‍රකාරව පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.113,682,114 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි. තවද තාවකාලිකව අක්‍රීය වී ඇති, ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාමගන්වා ඇති හා බැහැර කිරීමට ඇති දේපල, පිරියත සහ උපකරණ හඳුනාගැනීමට හා සාධාරණ අගය හෙළිදරව් කිරීමටද කටයුතුකර නොතිබුණි. | ඉදිරියේදී මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව, වත්කම් ලේඛනය පිළියෙල කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් යොදා ඇති බව, රෝහල ආරම්භයේ සිට ගෙවීම් වවුචර් පරීක්ෂාකර අදාළ වත්කම් හඳුනාගෙන ලේඛනයක් සකස් කිරීමට කටයුතු කරමින් පවතින බව. | සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින ජංගම නොවන වත්කම් නැවත අගය කිරීම හා ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 69 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවත්, ඊට පටහැනිව වත්කම මිලදීගත් දිනය සහ ඉවත් කිරීමේ දිනය නොසලකා මිලදීගත් වර්ෂයටම ක්ෂය කිරීමේ හා ඉවත්කළ වර්ෂය වෙනුවෙන් ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි. | ඉදිරියේදී මෙම දෝෂය නිවැරදි කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතය ප්‍රකාරව වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය හඳුනාගත යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 වර්ෂයේ සිට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු 2018 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය රු.12,876,545 ක් වූ ස්ථාවර වත්කම්වල ඉකුත් වර්ෂ 8 ක හා සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම පිළිවෙලින් රු.4,284,762 ක් හා රු.1,884,381 ක් වුවද, ඊට සමාන අගයකින් පරිත්‍යාග ගිණුම ක්‍රමානුකූලව ලියාහැරීමට කටයුතුකර නොතිබුණි. | මෙතෙක් පරිත්‍යාග ලෙස ලැබී ඇති වත්කම් ක්ෂය කර නැති බව හා ඉදිරියේදී මෙම දෝෂය නිවැරදි කරන බව. | ඊළඟ වර්ෂයේදී මෙම වරද නිවැරදි කර ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | වියදම් විෂයයන් 4 කට අදාළව 2018 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු.1,016,934ක් හා එදිනට උපචිත ආපන ශාලා කුලී ආදායම රු.80,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී මෙම දෝෂය නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා යන්ත්‍ර ක්ෂය රු.44,188 ක් හා පරිගණක ක්ෂය රු.126,000 ක් අඩුවෙන් ගණනයකර ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙම දෝෂය නිවැරදි කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට සේවකයින් 15 දෙනෙකු වෙනුවෙන් රු.698,153 ක පාරිතෝෂික ප්‍රතිපාදන වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | මෙම සේවකයින් 15 දෙනා ආදේශක සේවකයින් ලෙස හඳුනාගෙන පාරිතෝෂික ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු බව හා විගණන උපදෙස් පරිදි පාරිතෝෂික ප්‍රතිපාදන වෙන්කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | 2018 දෙසැම්බර් 31 දිනට ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය, විකිරණ ද්‍රව්‍ය, ECG ද්‍රව්‍ය හා දන්ත ශල්‍ය ද්‍රව්‍ය තොග වටිනාකම රු.4,618,856ක් අඩුවෙන්ද, පොදු ගබඩා ද්‍රව්‍ය, ලිපි ද්‍රව්‍ය හා නඩත්තු ද්‍රව්‍ය තොග වටිනාකම රු.213,759ක් වැඩියෙන්ද ගණනයකර ගිණුම්ගතකර තිබුණි. | තොග පොත් පරීක්ෂා කර බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය පනත | | | |
| (i) 3.1 උප වගන්තියේ (iii) ඡේදය | විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ සේවයේ නියුතු වෛද්‍ය වෘත්තිකයින් විසින් ඔවුන් අතරින් තෝරා පත්කරගනු ලබන තැනැත්තෙක් ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත්කර නොතිබුණි. | රෝහල් අධ්‍යක්ෂවරයාගේ කොන්ත්‍රාත් කාලය අවසන් කිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට මෙම පුරප්පාඩුව ඇතිවූ බව. | රෝහල් අධ්‍යක්ෂවරයා ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු නොවන බැවින්, පනතේ විධි විධාන ප්‍රකාරව ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් පත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 3.1 උප වගන්තියේ (v)ඡේදය | විජය කුමාරතුංග අනුස්මරණ පදනම නියෝජනය කරන්නා වූ එම පදනම විසින් නම් කරනු ලබන සාමාජිකයින් 4 දෙනෙකු පමණක් ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් ලෙස පත්කළ හැකි වුවද, එම පදනම නියෝජනය කරන සාමාජිකයින් 5 දෙනෙකු ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් ලෙස පත්කර තිබුණි. | පනතේ 3(1) (v) උප වගන්තිය ප්‍රකාරව, විජය කුමාරතුංග අනුස්මරණ පදනම නියෝජනය කරමින් හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරණායක කුමාරතුංග මැතිණිය, මහාචාර්ය කාලෝ පොන්සේකා මැතිතුමා, චන්ද්‍රා වික්‍රමසිංහ මහතා හා ආනන්ද විමලසේන මහතා පත්කර ඇති අතර පනතේ 3(1) (iv) ප්‍රකාරව, යම් වෘතීයක විශිෂ්ඨත්වයක් අත්කර ගෙන ඇති සාමාජිකයෙකු ලෙස එන්.ඒ.උමගිලිය මහතා පත්කර ඇත. | පනතේ විධි විධාන ප්‍රකාරව ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් පත්කර නොතිබුණු බැවින්, ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් පනතේ විධි විධාන ප්‍රකාරව පත්කළ යුතුය. |
| (iii) | 5.1 උපවගන්තිය | ආරෝග්‍යශාලා මණ්ඩලයේ රැස්වීම් මාසයකට එක් වරක් හෝ පැවැත්විය යුතු වුවද, 2018 වර්ෂය තුළ රැස්වීම් 3 ක් පමණක් පවත්වා තිබුණි. | හිටපු සභාපති මියගොස් ඇති බැවින් හා හිටපු අධ්‍යක්ෂ රෝහල් සේවය අවසන්කර ඇති බැවින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නොපැවැත්වීමට හේතු සොයා ගත නොහැකි බව. | පනතේ විධි විධාන ප්‍රකාරව ආරෝග්‍යශාලා මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (iv) | 7 වගන්තිය | ආරෝග්‍යශාලා මණ්ඩල පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සීදුවේ පිහිටි ඉඩමේ අයිතිය 2018 දෙසැම්බර් 31 දින වන විටත් ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ඉදිරියේදී අවශ්‍ය පියවර ගන්නා බව. | ඉඩමේ අයිතිය ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරා ගැනීම කඩිනම් කළ යුතුය. |
| (v) | 10 (1) හා 10 (2) උපවගන්ති | ආරෝග්‍යශාලා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන මණ්ඩලයේ බලතල, කාර්යය සහ කර්තව්‍ය පවරමින් ආරෝග්‍යශාලාවේ දෛනික කටයුතු පරිපාලනය කිරීම සඳහා කළමනාකරණ කමිටුවක් පත්කර නොතිබුණි. | 2019 ජූලි 08 දින කළමනාකරණ කමිටුවක් පත්කර ඇති බව. | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 702 (3) | මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.18,099,909 ක් වූ නඩත්තු හා පිරිසිදු කිරීම, අමු ආහාර ද්‍රව්‍ය සපයා ගැනීම, ආරක්ෂක සේවාව හා කිළිටි රෙදි සේදීමේ සේවාව යන කොන්ත්‍රාත්වල ගිවිසුම් පිටපත් ගිවිසුම් අත්සන් කළ වහාම විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවත්, මෙම වාර්තාවේ දිනය වන විටත් එම ගිවිසුම් පිටපත් ඉදිරිපත් කර නොතිබුණි. | 2019 සැප්තැම්බර් 19 දින සේවා ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත එවා ඇති බව. | විවිධ සේවාවන් සපයා ගැනීම් වෙනුවෙන් කොන්ත්‍රාත් ආයතන සමඟ ගිවිසුම්වලට එළඹී වහාම එම ගිවිසුම්වල පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2015 මැයි 28 දිනැති සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ අංක 01 - 21/2015 | (i) චක්‍රලේඛයේ 5.1.3 හා 5.1.4 ඡේද ප්‍රකාරව, සති ආහාර වැඩසටහන පිළියෙල කිරීමට ආයතන ප්‍රධානියා විසින් ආහාර කළමනාකරණ කමිටුවේ සහාය ලබාගැනීමට, පිළියෙල කරනු ලබන සති ආහාර වැඩසටහන අදාළ අංශ වෙත ලබාදීමට හා එළවළු සැපයීමේ මාසික වැඩසටහනක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | ආහාර කළමනාකරණ කමිටුවේ සහාය ඇතිව සති ආහාර වැඩසටහන හා මාසික වැඩසටහන 2019 සැප්තැම්බර් මාසයේ සිට පිළියෙල කරන බව. | අමාත්‍යාංශය නිකුත්කර ඇති පොදු චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| | | (ii) චක්‍රලේඛයේ 8.1.1, 8.1.3 හා 8.1.4 ඡේද ප්‍රකාරව, සෑම මාසයකම පළමුවනදා නේවාසික රෝගීන් වෙනුවෙන් සෞඛ්‍ය 31 ආකෘති පත්‍රයෙහි වාට්ටුව සඳහා වෙනම අළුත් ආහාර වට පත්‍රිකාවක් පිළියෙල කිරීමට, අදාළ නිලධාරීන් විසින් ඇඳ ඉහපත් පරීක්ෂාකර ආහාර වට පත්‍රිකාවේ නියමිත ආහාරය සටහන් කිරීමට, එක් එක් රෝගීන්ගේ ආහාර වට සාරාංශකර දවසට අවශ්‍ය ආහාර වට ප්‍රමාණය ගණනය කිරීමට හා එය සිටින රෝගීන් සංඛ්‍යාව සමඟ සැසඳීමට කටයුතුකර නොතිබුණි. | සෞඛ්‍ය 31 ආකෘති පත්‍රය පිළියෙල කිරීම සඳහා වාට්ටු ලිපිකරුවෙකු නොමැති බැවින් එය දැනට පිළියෙල නොකරන බව හා ඉදිරියේදී වට්ටු ලිපිකරුවෙකු බඳවා ගැනීමට කටයුතු කරන බව. | අමාත්‍යාංශය නිකුත්කර ඇති පොදු චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | චක්‍රලේඛයේ 10.5 හා 11.7 ඡේද ප්‍රකාරව, පිසූ ආහාර ඉතිරිව අපතේ යාම පිළිබඳ පරීක්ෂාකර ඒ අනුව අමු ආහාර යම් ප්‍රතිශතයක් අඩුකර ඇණවුම් කිරීමට හා අහඹු ලෙස හදිසි පරීක්ෂණ පවත්වා අනාවරණය වූ කරුණු පිළිබඳ රෝහල් ප්‍රධානියා දැනුවත් කිරීමට කටයුතුකර නොතිබුණි. | අහඹු ලෙස හදිසි පරීක්ෂණ පවත්වන බව. | -එම- |
| (iv) | චක්‍රලේඛයේ 14.1, 15.1 හා 15.3 ඡේද ප්‍රකාරව, පිසින ලද ආහාර ද්‍රව්‍ය බෙදීමට පෙර නිදර්ශන පෙන්වීමට හා ආහාර කාඩ්පත් ලබාගෙන ඇති රෝහල් සේවකයින්ට පමණක් නියමිත ආහාර ප්‍රමාණය ලබාදෙන බව තහවුරු කරගැනීමට කටයුතුකර නොතිබුණි. | සේවක කාඩ්පත් ක්‍රමය 2019 සැප්තැම්බර් සිට ක්‍රියාත්මක වේ. | අමාත්‍යාංශය නිකුත්කර ඇති පොදු චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.45,732,117 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.14,269,158 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.31,462,959 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, රාජ්‍ය ප්‍රදාන රු.45,920,000 කින් වැඩි වී තිබුණද වර්ෂයේ වියදම් වැඩිවීම රු.17,886,115 ක් පමණක් වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තු කර නොතිබුණු වෛද්‍ය සැපයුම් වර්ග 71 කින් ඒකක 937,258 ක් වෛද්‍ය සැපයුම් අංශයෙන් මිලදී ගැනීම සඳහා රු.1,519,607 ක් වැයකර තිබුණි. එසේම ඇස්තමේන්තු වියදම රු.55,494,999 ක් වූ වෛද්‍ය සැපයුම් වර්ග 192 ක ඒකක 4,519,611 ක් | රෝහලේ සමස්ථ සැපයුම් අවශ්‍යතාවය ඇතුළත් ඇස්තමේන්තුවක් වාර්ෂිකව වෛද්‍ය සැපයුම් අංශය වෙත ඉදිරිපත් කරන බව, ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 71 ක් වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුළත් නැති බව විගණන විමසුමේ සඳහන් වුවද, | තාත්වික වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එම අංශයෙන් මිලදීගෙන නොතිබුණු අතර වෛද්‍ය සැපයුම් වර්ග 60 කින් ඒකක 3,360,790 ක් මිලදී ගැනීමට ඇස්තමේන්තුකර තිබුණද ඉන් සියයට 28 ක් එනම් ඒකක 947,251 ක් පමණක් මිලදීගෙන තිබුණි. තවද වෛද්‍ය සැපයුම් වර්ග 85 කින් ඒකක 4,370,769 ක් මිලදී ගැනීමට ඇස්තමේන්තු කර තිබුණද ඒකක 5,741,364 ක් එම අංශයෙන් මිලදීගෙන තිබුණු අතර වැඩිපුර මිලදීගත් ප්‍රමාණය ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 31 ක් විය. | ඉන් ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 61 ක් වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුළත් කර ඇති බව, අපේක්ෂිත ප්‍රමාණය ඉක්මවා ප්‍රතිකාර ලබාදීමට සිදුවූ බැවින් අමතර සැපයුම ලබා ගැනීමට සිදුවූ බව, අනපේක්ෂිත ලෙස රෝගී ප්‍රතිකාර සඳහා අත්‍යාවශ්‍ය වූ බැවින් ඉතිරි ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග **10** සපයා ගත් බව, ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 192 ක් වෛද්‍ය සැපයුම් අංශය විසින් ඒවා අවශ්‍ය අවස්ථාවලදී ලබා නොදුන් බව. | |
| (ආ) | ඇස්තමේන්තු කිරීමකින් තොරව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙතින් පිරිවැය රු.23,044,956 ක ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | තාත්වික වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ආරෝග්‍යශාලා මණ්ඩලයේ වාට්ටු 05 ක ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග 51 ක පිරිවැය රු.3,932,503 ක් වූ ඒකක 1225 ක තොග අතිරික්තයක් පවතින බව 2018 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණු භෞතික තොග සමීක්ෂණයකදී අනාවරණය වී තිබුණි. ඊට හේතු සොයා බලා නිසි පිළියම් යෙදීමට කටයුතු කර නොතිබුණි. | භෞතික තොග සමීක්ෂණය නිවැරදිව සිදුකර ඇති නමුත් තොග සමීක්ෂණ වාර්තාව පරිගණකයෙන් පිළියෙල කිරීමේදී ඇතිවූ දෝෂයක් බව. | සිදුවී ඇති දෝෂය පැහැදිලිව හෙළදරව් කළ යුතුය. එය නිසි ලෙස නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | වර්ෂ 2005 - 2016 අතර කාලය තුළදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටි සේවකයින් 55 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් දායකය නියමිත කාලය තුළ ප්‍රේෂණය කර නොතිබීම හේතුවෙන් රු.286,718 ක අධිභාරයක් ගෙවීමට සිදු වී තිබුණි. | 2005 – 2016 කාලය තුළ බඳවා ගෙන සිටි සේවකයින් වෙනුවෙන් සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවා නොතිබීම හේතුවෙන් පසුව ඒවා ගෙවීමට සිදුවිය. ඒ හේතුවෙන් අධිභාරයක් ගෙවීමටද සිදුවිය. | වර්ෂ 10 කට අධික කාලයක් සේවක භාරකාර අරමුදලට දායක මුදල් නොගෙවීම හේතුවෙන් අධිභාරයක් ගෙවීමට සිදුවීම නිලධාරීන්ගේ නොසැලකිල්ල යටතට ගැනෙන පාඩුවක් බැවින්, මෙම පාඩුව අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ආරෝග්‍යශාලා මණ්ඩලය සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ මූල්‍ය කළමනාකාර නමින් වූ තනතුරක් සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා පුවත්පත් දැන්වීමක් පළ කර තිබුණි. එසේ වුවද එවන් තනතුරක අවශ්‍යතාවය හා එම තනතුරට අදාළ කාර්යභාරයන් මොනවාද යන්න රෝහල විසින් හඳුනාගෙන නොතිබුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගත නොහැකිවීමෙන් පුවත්පත් දැන්වීම සඳහා වැයකර තිබුණු රු.139,080 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | හිටපු ගණකාධිකාරිනිය සේවයෙන් ඉවත් කිරීම හේතුවෙන් එම තනතුර සඳහා අනුමත සුදුසුකම් ලත් වෙනත් නිලධාරියෙකු බඳවා ගත යුතුව ඇති බව, රෝහලේ ඉදිරි සංවර්ධන ව්‍යාපෘති සලකා බලන විට ගණකාධිකාරී තනතුරට වඩා ඉහළ තනතුරක් වූ සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුරක් ඇති කිරීම සුදුසු බව කළමනාකරණ මණ්ඩලය විසින් හඳුනාගෙන ඇති බව, ආරෝග්‍යශාලා මණ්ඩලය පනතේ බලතල ප්‍රකාරව රෝහලේ පරිපාලනයට හිතකර විය හැකි සියළු දේ කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතුය යන්න අනුව මූල්‍ය කළමනාකරු/ සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ආවරණ අනුමැතියට යටත්ව බඳවා ගැනීමට දැන්වීම් පළ කළ බව. | නව තනතුරු ඇති කිරීමේදී හා අතිරේක කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. එම දෙපාර්තමේන්තුවේ ආවරණ අනුමැතියට යටත්ව බඳවා ගැනීම් සිදුකිරීම හෝ ඒ සඳහා දැන්වීම් පළකිරීම සිදු නොකළ යුතුය. මෙම නිෂ්කාර්ය වියදම වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. |

**3.2** අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු මුදල් උපයෝජනය දුර්වල මට්ටමක පැවතුණි. ලැබී තිබුණු මුදලින් 2018 ජනවාරි 01 දිනට ඉතිරිය රු.28,861,901ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී රු.39,100,000 ක් ලැබී තිබුණු අතර රු.19,543,123 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරිය රු.48,418,778 ක් විය. | නව ගොඩනැගිල්ල ඉදිකිරීම හා නව ජෙනරේටරය සපයා සවිකර ගැනීමේ ප්‍රසම්පාදන කටයුතුවල සිදුවූ ප්‍රමාදය හා වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේ තාක්ෂණික ඇගයීම ප්‍රමාදවීම හේතුවෙන් 2018 වර්ෂය සඳහා ලැබී තිබුණු ප්‍රතිපාදන ඉතිරි වූ බව හා 2019 වර්ෂයේදී කාර්යක්ෂම ලෙස ප්‍රතිපාදන උපයෝජනය කරන බව. | මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී ආරෝග්‍යශාලා මණ්ඩලයේ නඩත්තු හා පිරිසිදු කිරීම සහ කිළිටි රෙදි සේදීම යන සේවාවන් දෙක වෙනුවෙන් මුළු මුදල රු.7,182,892 ක් වැයකර තිබුණි. මෙම සේවාවන් දෙක සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2, 2.11.3, 4.3.1, 6.3.6 හා 6.3.3 මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද එළඹ තිබුණු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |
| (i) ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සම්බන්ධිත පාර්ශවයන් සමඟ අවශ්‍ය සන්නිවේදන සබඳතා පවත්වාගෙන යාම, අවශ්‍ය දත්ත හා තොරතුරු එක්රැස් කිරීම, පිරිවිතර ඇතුළු ලංසු ලේඛන පිළියෙල කිරීම හා ඒවා සමාලෝචනය කිරීම හා අනුමත කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම සිදුකර නොතිබුණි. ලංසු විවෘත කිරීමේ සටහන්, ලංසු ඇගයීම් වාර්තා හා ප්‍රසම්පාදන කමිටු වාර්තා නිශ්චිත ආකෘතියට අනුව පිළියෙල කර නොතිබුණි. තවද සියළුම ආශ්‍රිත වියදම් ඇතුළත් මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කර නොතිබුණි. | 2019 වර්ෂයේදී තාක්ෂණික ඇගයීම් වාර්තා මෙන්ම ප්‍රසම්පාදන කමිටු තීරණ ඇතුළත් වාර්තා නිශ්චිත ආකෘතියට අනුව පිළියෙල කර ඇති බව හා ඇස්තමේන්තු පිළියෙල කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) පිරිසිදු කිරීම් සඳහා භාවිතා කරන රසායන ද්‍රව්‍යවල තිබිය යුතු ප්‍රමිතිය ලංසු ලේඛනවල ඇතුළත් කර නොතිබුණි. ලංසුකරුවන් භාවිතා කරන රසායන ද්‍රව්‍යවල ප්‍රමිතිය පිළිබඳ තහවුරුවක් ලබාගෙන නොතිබුණි. | 2018 වර්ෂයේදී ආසාදන පාලන ඒකකය සඳහා ස්ථිර හෙද නිලධාරියෙකු පත්කර නොතිබුණු බැවින් රසායන ද්‍රව්‍යවල ප්‍රමිතිය පරීක්ෂා කළ නොහැකි වූ බව. | පිරිසිදු කිරීම් සඳහා යොදාගන්නා රසායන ද්‍රව්‍යවල තිබිය යුතු ප්‍රමිතිය ලංසු ලේඛනවල ඇතුළත් කළ යුතු අතර ලංසුකරුවන් යොදා ගන්නා රසායන ද්‍රව්‍යවල ප්‍රමිතිය පිළිබඳ තහවුරුවක් ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | පිරිසිදු කිරීමේ සේවා ගිවිසුමේ 10 වගන්තිය ප්‍රකාරව, කම්කරුවන් 15 දෙනෙකුද, වැඩ පරීක්ෂකවරයෙකුද දිනකට පැය 12 ක් සේවයේ යෙදිය යුතු අතර සේවකයෙකු අඛණ්ඩව පැය 24 කට වඩා සේවයේ නොයෙදවිය යුතුය. නමුත් 2018 ජනවාරි 01 දින සිට ඔක්තෝබර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අවස්ථා 45 කදී පැය 24 ඉක්මවා පිරිසිදු කිරීමේ සේවකයින් සේවයේ යොදවා තිබුණු අතර, අවස්ථා 188 කදී නියමිත සංඛ්‍යාවට වඩා අඩුවෙන් සේවකයින් යොදවා තිබුණි. | පැය 24 කට වඩා වැඩියෙන් සේවයේ යෙදවූ අවස්ථාවලදී හා සේවකයින් අඩුවෙන් යෙදවූ අවස්ථාවලදී ගිවිසුම ප්‍රකාරව දඩ මුදල් හා දිනක වැටුප අයකර ඇති බව. | සේවකයින් අඩුවෙන් යෙදවීමෙන් සේවය නිසියාකාරව නොලැබෙන බැවින් දඩ මුදල් හා දිනක වැටුප අයකිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාත්කරු වෙතින් කාර්යය ඉටුකරවා ගත යුතුය. |
| (iv) | පිරිසිදු කිරීමේ සේවා ගිවිසුමේ 18 වගන්තිය ප්‍රකාරව, කොන්ත්‍රාත්කරු විසින් සපයාදිය යුතු රසායන ද්‍රව්‍ය නියමිත ප්‍රමාණවලින් සපයා නොතිබුණි. 2018 ජනවාරි 01 දින සිට ඔක්තෝබර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී රසායන ද්‍රව්‍ය වර්ග 13 ක්, ලීටර් 1 සිට ලීටර් 20 දක්වාද, බෝතල් 2 සිට බෝතල් 50 දක්වාද, කිලෝග්‍රෑම් 06 ක් හා කැට 10 වැනි ප්‍රමාණවලින් අඩුවෙන් සපයා තිබුණි. | 2018 වර්ෂයේදී ආසාදන පාලන හෙද නිලධාරියෙකු ස්ථිරව පත්කර නොතිබුණු බැවින් මෙම කාර්යය පැවරීමට නිලධාරියෙකු නොසිටි බව, නමුත් 2018 වර්ෂයේදී ලැබුණු රසායන ද්‍රව්‍ය ගබඩා භාරකරු විසින් වෙනම ලේඛණයක සටහන් කර ඇති බව, 2019 වර්ෂයේ සිට ආසාදන පාලන හෙද නිලධාරිනිය විසින් රසායන ද්‍රව්‍යවල ප්‍රමිතිය පරීක්ෂා කර භාර ගනු ලබන බව හා අඩුවෙන් සපයන රසායන ද්‍රව්‍ය සඳහා මාසික බිල්පත්වලින් අඩුකිරීම් කරන බව. | රසායන ද්‍රව්‍ය අඩුවෙන් සැපයීම සේවය නිසි ප්‍රමිතියෙන් ඉටුකර ගත නොහැකි වීමට බලපාන බැවින් මාසික බිල්පත්වලින් අඩුකිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. ගිවිසුම ප්‍රකාරව සේවය ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (v) | පිරිසිදු කිරීමේ සේවා ගිවිසුමේ 13 (i) වගන්තිය ප්‍රකාරව, සේවාව උසස් තත්ත්වයෙන් සිදුකළ බවට ඒ ඒ අංශ හා වාට්ටු භාර නිලධාරීන්ගෙන් සහතිකයක් ලබාගෙන මාසික බිල්පත් සමඟ ඉදිරිපත් කළ යුතු විය. බොහෝ අංශවලින් එම සහතිකය ලැබී නොතිබුණු නමුත් ඒ පිළිබඳව නොසළකා සමාලෝචිත වර්ෂයේදී රු.6,477,696 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. | 2018 ජනවාරි සිට 2018 ඔක්තෝබර් දක්වා කාලය තුළදී සහතික ඉදිරිපත් නොකළ අංශ සඳහා ගිවිසුම් ප්‍රකාරව අඩුකිරීම් කර ගෙවීම් කර ඇති බව හා 2019 වර්ෂයේදී මේ තත්ත්වය නිවැරදි කර ඇති බව. | පිරිසිදු කිරීමේ සේවාව උසස් තත්ත්වයෙන් සිදුකල බවට එක් එක් අංශය භාර නිලධාරීන්ගෙන් ලබාගත් සහතිකය මත පමණක් ගෙවීම් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී ආරෝග්‍යශාලා මණ්ඩලයට ආරක්ෂක සේවය සපයාගැනීමේ ගිවිසුමේ 07 වගන්තිය ප්‍රකාරව, කාන්තා ආරක්ෂක නියාමකයින් දිවා කාලයේ පමණක් සේවයේ යෙදවිය යුතුය. නමුත් කාන්තා ආරක්ෂක නියාමකයින් 10 දෙනෙකු දින 191 ක් රාත්‍රී සේවයෙහි යොදවා තිබුණි. | 2018 වර්ෂයේදී හෙද නේවාසිකාගාරයේ සිදු වූ අනපේක්ෂිත ගැටළු සහගත සිද්ධීන් හේතුවෙන් කාන්තා ආරක්ෂක නියාමකවරියක් පමණක් සේවයේ යොදා ගත් බව හා 2019 වර්ෂයේ සිට ගිවිසුම සංශෝධනය කළ බව. | ආරක්ෂක සේවාව සපයා ගැනීම වෙනුවෙන් එළඹී ඇති ගිවිසුමේ ඇතුළත් වගන්ති ප්‍රකාරව කාර්යය ඉටුකරවා ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී ආරෝග්‍යශාලා මණ්ඩලයට අමු ආහාර ද්‍රව්‍ය සපයා ගැනීම වෙනුවෙන් රු.4,801,422 ක් වැයකර තිබුණි. සැපයුම්කරු තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3, 2.12 (අ), 3.12.2, 5.3.1 හා 5.3.2 මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |
| (i) | තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව හා ලංසු ඇගයීම් සාරාංශ වාර්තාව නිශ්චිත ආකෘතියට අනුව පිළියෙල කර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට මෙම අඩුපාඩු සියල්ල නිවැරදි කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. ඉදිරි ප්‍රසම්පාදනවලදී මෙම අඩුපාඩු නිවැරදිකර ගත යුතුය. |
| (ii) | ප්‍රසම්පාදන කමිටුවෙහි හා තාක්ෂණික ඇගයීම් කමිටුවෙහි සාමාජිකයන් විසින් සිදුකළ යුතු ප්‍රකාශ ලබාදී නොතිබුණි. | 2019 වර්ෂයේ සිට මෙම අඩුපාඩු සියල්ල නිවැරදි කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. ඉදිරි ප්‍රසම්පාදනවලදී මෙම අඩුපාඩු නිවැරදිකර ගත යුතුය. |
| (iii) | සාර්ථකව කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සඳහා ලංසුකරුවන් වෙත ඇති හැකියාව තීරණය කිරීමට උපමාන නිශ්චිතව හඳුනාගෙන පූර්ව සුදුසුකම් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | -එම- | -එම- |
| (iv) | ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් භාවිතා කරනු ලබන ලංසු ලේඛනවල යෝග්‍යතාවය පිළිබඳව ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පරීක්ෂාකර අනුමතකර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (v) | ජයග්‍රාහී ලංසුකරුට තිබිය යුතු, ඍජුවම සුදුසු බව තහවුරු කෙරෙන උපමාන හා සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා ඇතුළු ලංසු පිළියෙල කිරීමට ලංසුකරුට අවශ්‍යවන මූලික තොරතුරු ඇතුළත්ව ලංසු ආරාධනාව පිළියෙලකර නොතිබුණි. | -එම- | -එම- |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය ප්‍රකාරව අනුමත කිසිදු තනතුරක් වෙනුවෙන් බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි පිළියෙලකර නොතිබුණි. | රෝහලට අනන්‍ය වූ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් පිළියෙල කිරීම සංකීර්ණ ක්‍රියාවලියක් බව, එය පිළියෙල කරන තෙක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය පරිදි රජයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් අනුව බඳවා ගැනීම් හා උසස් කිරීම් සිදුකරන බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව, රෝහල සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ එක් එක් තනතුරට අදාළ බඳවාගැනීම් හා උසස් කිරීම් පටිපාටි පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | රෝගී සත්කාර සේවය හා ඍජුවම බැඳී පවතින ප්‍රධාන තනතුරු 6 ක පුරප්පාඩු 18 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පිරවීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශය විසින් ලබා දෙන වරප්‍රසාද ආරෝග්‍යශාලා මණ්ඩලයෙන් නොලැබෙන බැවින් පුහුණුව ලත් සුදුසු නිලධාරීන් බඳවා ගැනීමේ ගැටළු පවතින බව, 2019 වර්ෂයේදී වෛද්‍ය නිලධාරීන් 4 දෙනෙකු හා විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරීවරයෙකු බඳවා ගෙන ඇති බව හා වෛද්‍යවරු බඳවා ගැනීම සඳහා නැවත පුවත්පත් දැන්වීම් පළ කළද, සුදුසුකම්ලත් අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් බඳවා ගැනීම් ප්‍රමාදවී ඇති බව. | පුහුණුව ලත් සුදුසුකම් ඇති අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම පිළිබඳව අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර විසඳුමකට එළඹිය යුතුය. |
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව, ආරෝග්‍යශාලා මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුරට බඳවාගෙන තිබුණු නිලධාරිනිය වෙත 2018 නොවැම්බර් සිට 2019 ජූලි දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී පමණක් මාසිකව රු.30,000 බැගින් රු.272,000 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. | ආරෝග්‍යශාලා මණ්ඩලය පනතේ බලතල ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයට පාලන බලතල හිමි වන බව, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්කාර්යභාරය සඳහා රු.30,000 ක මාසික දීමනාවක් ගෙවා සුදුස්සෙකු පත්කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බව. | ආරෝග්‍යශාලා මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කළමනාකරණ සහකාර සේවයේ බඳවා ගැනීම් පටිපාටිය අනුගමනය කර සීමිත තරඟ විභාගයක් පැවැත්වීමකින් තොරව, වෛද්‍ය ලේඛනාගාර සහකාර තනතුරට 2013 දෙසැම්බර් 10 දින කණිෂ්ඨ සේවකයෙකු බඳවා ගෙන තිබුණි. | සීමිත තරඟ විභාගයක් පැවැත්වීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවූ බැවින් සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමෙන් පමණක් බඳවා ගැනීම සිදුකළ බව හා ඉදිරියේදී තරඟ විභාගයක් පවත්වා සුදුසු අයදුම්කරු තෝරා ගැනීමට කටයුතු කරන බව. | රජයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි අනුගමනය කරන්නේ නම් එම බඳවා ගැනීම් පටිපාටිවල දක්වා ඇති උපදෙස් හා විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | වෛද්‍යවරු තිදෙනෙක් සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ අංක 1979 හි නියමයන්ට පටහැනිව විගණිත දිනය වූ 2018 නොවැම්බර් 12 දින වන විට, දින 12 කට අධික කාලයක් රාජකාරි දිනපොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | රාජකාරි දින පොත් පවත්වා ගැනීම සම්බන්ධයෙන් අදාළ වෛද්‍ය නිලධාරීන් වෙත අවවාද ලිපි නිකුත් කර ඇති බව හා වර්තමානයේදී දින පොත් පරීක්ෂා කිරීම විධිමත්ව සිදුකරන බව. | වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරි දින පොත් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛවල දක්වා ඇති උපදෙස් අනුගමනය කළ යුතුය. එම උපදෙස් අනුගමනය නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 207 ක් ප්‍රමාද වී 2019 සැප්තැම්බර් 23 දින විගණනය සඳහා ඉදිරිපත්කර තිබුණි. | හිටපු ගණකාධිකාරීවරිය චෝදනා කිහිපයකට වරදකරුවී 2018 ජූලි 28 දින සේවයෙන් පහ කිරීම හා 2018 ජූලි මාසයේ සිට හිටපු අධ්‍යක්ෂකගේ සේවය අවසන් වීම හේතුවෙන් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කළ නොහැකි වූ බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

**4.2** **සංයුක්ත සැලැස්ම**

**----------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වන පරිච්ඡේදයේ 5.1.2 ඡේදය ප්‍රකාරව, ආයතනයේ සංවිධාන සැලැස්ම, ආයතනයේ ශක්තිය, දුර්වලතා, බාහිර තර්ජන හා අවස්ථා පිළිබඳ විශ්ලේෂණය (SWOT Analyses), අරමුණුවලට ගැලපෙන පරිදි අදාළ කාලසීමාව තුළ ළඟාවීමට අපේක්ෂිත ඉලක්ක හා ඒ සඳහා ක්‍රියාත්මක උපායමාර්ග ඇතුළත්ව සංයුක්ත සැලැස්ම පිළියෙල කල යුතු අතර එය වාර්ෂිකව යාවත්කාලීන කල යුතු වේ. එහෙත් රෝහල 2016 - 2020 කාලපරිච්ඡේදය සඳහා පිළියෙලකර තිබුණු සංයුක්ත සැලැස්ම ඒ අයුරින් පිළියෙල කර නොතිබුණු අතර 2018 වර්ෂය සඳහා එය යාවත්කාලීන කරද නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව, සංයුක්ත සැලැස්මක් පිළියෙලකර ක්‍රියාත්මක කළ යුතුය. |